# 4. කර්මාන්ත

## 4.1 සමස්ත උපනතීන්

1995 වර්ෂයේදී කාර්මික නිෂ්පාදනය සියයට 10.2 කින් වර්ධනය වූ අතර මෙම වර්ධනය කෘෂිකාර්මික අංශය ආර්ථිකයේ ලබා ගෙන සිටි ප්‍රමුඛස්ථානය පළමු වරට කාර්මික අංශයට හිමිකර දීමට සමත් විය. කාර්මික අංශයේ මෙම වර්ධනයට අපනයනය පෙරදැරි කරගත් මෙන්ම දේශීය වෙළඳපල පදනම් කරගත් කර්මාන්තවල කැපී පෙනෙන වර්ධනයන් ඉවහල් විය. නිමැවුම් කර්මාන්ත නිෂ්පාදනයෙන් සියයට 82 ක් පමණ වූ කම්හල් නිමැවුම්, 1995 වර්ෂයේ ආර්ථික වර්ධනයෙන් සියයට 28 කට දායක විය.

1994 දී මැතිවරණ සම්බන්ධව පැවැති අවිනිශ්චිතතාවයන් සහ රජය වෙනස්වීමත් සමග ඇති වූ කම්කරු ආරවුල් හේතුවෙන් තාවකාලික පසුබෑමකට ලක් වූ කර්මාන්ත අංශය, 1995 වර්ෂයේදී කැපී පෙනෙන නිෂ්පාදන වර්ධන ප්‍රවණතාවයක් පෙන්නුම් කරමින් යථා තත්වයට පත් විය. පෞද්ගලික ව්‍යාපාර කටයුතුවල වර්ධනය හේතුවෙන් ඇතිවූ දේශීය ඉල්ලුම ඉහළ යාමත්, ආර්ථික අවපාතයකට පසුව ප්‍රධාන කාර්මික රටවල ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීම නිසා ඇති වූ විදේශ ඉල්ලුම ඉහළ යාමත් මෙම සතුටුදායක වර්ධනයට ඉවහල් විය. එමෙන්ම 1995 වර්ෂයේදී ශ්‍රී ලංකා රුපියලෙහි සිදුවූ සාපේක්ෂව ඉහළ අවප්‍රමාණය වීමද කාර්මික වර්ධනය සඳහා උපකාරි විය. කෙසේ වුවද, අඛණ්ඩව පැවැති කම්කරු ආරවුල් හා වැඩි වැටුප් සඳහා කරන ලද බලපෑම් වැඩිවීම, අධික මූල්‍ය පිරිවැය, යටිතල පහසුකම් සම්බන්ධව පැවැති සංරෝධකයන් සහ විදේශ ප්‍රාග්ධන ගලාඒම් වල සීඝ්‍ර අඩුවීම හේතුකොට ගෙන කර්මාන්ත අංශයට 1995 වර්ෂය තුලදී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. විදේශීය ප්‍රාග්ධන ගලාඒම් පහල යාම හේතුවෙන් ඇති වූ කොටස් වෙළඳපළ කටයුතුවල පසුබෑම නිසා වැඩි වශයෙන් බැංකු ණය තුලින් ප්‍රාග්ධනය සපයා ගැනිමට කාර්මික අංශයට සිදුවිය.


## 4.2 නිෂ්පාදනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතට යටත් නොවන කර්මාන්ත 350 ක් ආවරණය වන පරිදි කරන ලද කාර්මික නිෂ්පාදනය පිළිබඳ වාර්ෂික සමීක්ෂණ දත්තයන්, රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදනය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ඇති කර්මාන්තවල අපනයන දත්තයන් මත කරන ලද ඇස්තමේන්තුවලට අනුව, 1995 වර්ෂයේදී කාර්මික නිෂ්පාදනය සියයට 10.2 කින් වර්ධනය වි ඇත. කාර්මික නිෂ්පාදනය වර්තමාන මිල ගණන් අනුව සියයට 16.1 කින් වැඩි විය. මේ අනුව කම්හල් නිමැවුම් සඳහා වන ගම්‍ය මිල දර්ශකය සියයට 5.3 ක් වේ.


රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදන සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ යන ප්‍රධාන කාර්මික කාණ්ඩයන් දෙකෙහි ඉහළ ක්‍රියාකාරිත්වය කාර්මික නිෂ්පාදනයේ වර්ධනයට බොහෝදුරට දායක විය. මෙම කාණ්ඩයන් දෙක මුළු කාර්මික නිෂ්පාදන වර්ධනයෙන් සියයට 79 කට දායක විය.

පෙර වර්ෂවලදී මෙන්ම, 1995 වර්ෂයේදී ද කාර්මික අංශයේ වර්ධනය මුළුමනින්ම ඇති වූයේ පෞද්ගලික අංශයෙනි. 1994 වසරේ දි සියයට 11 කින් වර්ධනය වූ පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදනය, 1995 වසරේදි සියයට 12 කින් වර්ධනය විය. පෞද්ගලික අංශයේ කාර්මික නිමැයුම් එකතු

රූප සටහන 4.1
**කාර්මික නිෂ්පාදන වර්ධනය සහ සංයුතිය**




රූප සටහන 4.1.1
කාර්මික නිෂ්පාදනයේ ආංශික සංයුතිය
1995




රූප සටහන 4.1.2
සමස්ත සහ පෞද්ගලික අංශයේ මූර්ත වර්ධන අනුපාතිකයන් (1991-1995)

සංඛ්‍යා සටහන 4.1

## කාර්මික නිෂ්පාදන වටිනාකම 1991 - 1995 (1990 ස්ථාවර මිල අනුව)

| කාර්මික කාණ්ඩය | රුපියල් දශ ලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) | 1994 | 1995(අ) |
| 1 ආහාර පාන වර්ග සහ දුම්කොළ | 24,000 | 26,087 | 28,304 | 30,445 | 33,641 | 7.6 | 10.5 |
| 2 රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 32,265 | 38,805 | 45,540 | 48,333 | 55,480 | 6.1 | 14.8 |
| 3 දැව හා දැව නිෂ්පාදිත | 710 | 797 | 939 | 1,085 | 1,243 | 15.5 | 14.5 |
| 4 කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2,180 | 2,628 | 3,140 | 3,565 | 3,508 | 13.5 | -1.6 |
| 5 රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 19,942 | 19,752 | 23,683 | 25,838 | 27,543 | 9.1 | 6.6 |
| 6 ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 7,850 | 9,451 | 10,349 | 11,643 | 12,516 | 12.5 | 7.5 |
| 7 මූලික ලෝහ නිෂ්පාදිත | 1,156 | 1,294 | 1,178 | 1,568 | 1,377 | 33.1 | -12.2 |
| 8 සකස්කළ ලෝහ නිෂ්පාදිත යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 4,702 | 5,314 | 5,203 | 5,931 | 6,139 | 14.0 | 3.5 |
| 9 අන්තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 1,978 | 2,124 | 2,366 | 2,617 | 3,005 | 10.6 | 14.8 |
| එකතුව | 94,783 | 106,252 | 120,702 | 131,025 | 144,452 | 8.6 | 10.2 |

(අ) තාවකාලික

මූලයයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සංඛ්‍යා සටහන 4.2

## පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන දර්ශකය 1991 - 1995 (1990 = 100)

| කාර්මික කාණ්ඩය | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) | ප්‍රතිශත වෙනස 1994 | ප්‍රතිශත වෙනස 1995(අ) |
|---|---|---|---|---|---|---|---|
| 1 ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 111 | 120 | 129 | 140 | 155 | 8.0 | 10.4 |
| 2 රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 116 | 144 | 168 | 179 | 206 | 6.1 | 14.8 |
| 3 දැව හා දැව නිෂ්පාදිත | 101 | 106 | 123 | 149 | 170 | 21.1 | 14.1 |
| 4 කඩදාසි හා කඩදාස නිෂ්පාදිත | 121 | 184 | 226 | 263 | 266 | 16.3 | 1.0 |
| 5 රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 97 | 121 | 132 | 159 | 196 | 20.0 | 23.6 |
| 6 ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 106 | 137 | 159 | 212 | 228 | 33.7 | 7.5 |
| 7 මූලික ලෝහ නිෂ්පාදිත | 145 | 167 | 225 | 266 | 305 | 18.0 | 15.0 |
| 8 සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවහන උපකරණ | 116 | 126 | 124 | 141 | 147 | 13.8 | 3.9 |
| 9 අන්තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 122 | 127 | 152 | 168 | 193 | 10.6 | 14.8 |
| එකතුව | 114 | 137 | 155 | 172 | 192 | 10.9 | 12.1 |

(අ) තාවකාලික

මූලයයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

අගය 1995 වර්ෂයේ මුළු කාර්මික නිෂ්පාදන එකතු අගයෙන් සියයට 91 ක් විය. ක්‍රියාශීලි ව්‍යවසායකත්ව පන්තියක් බිහිවීම සහ රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලිකරණය හේතුකොට ගෙන රාජ්‍ය අංශයේ කර්මාන්ත වල සාපේක්ෂ වැදගත්කම අඩුවීමත් සමගම පෞද්ගලික අංශය කාර්මික නිෂ්පාදන කටයුතුවල ප්‍රමුඛත්වය ලබා ගෙන ඇත.

### රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත

1995 වසරේදී රෙදිපිළි ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදනය මූර්ත වශයෙන් සියයට 14.8 කින් වර්ධනය වී කාර්මික නිෂ්පාදන වර්ධනයට සියයට 53 කින් ද මුළු කාර්මික නිෂ්පාදන ප්‍රමාණයට සියයට 47 කින්ද දායක විය. 1995 වසරේදී එක්සත් ජනපදය විසින් ඇඟළුම් අපනයනය සඳහා දෙන ලද පංගු ප්‍රමාණය සියයට 9 කින් වැඩිවී තිබුනද, අපනයන ප්‍රමාණයෙන් වැඩි කොටසක් පංගු නොවන ඇඟළුම් අංශයෙන් සිදුවිය. ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයනය කළ මුළු රෙදිපිළි හා ඇඟළුම් ප්‍රමාණය සියයට 21 කින් වර්ධනය විය. පංගු ක්‍රමය යටතේ වූ ඇඟළුම් අපනයනය සියයට 6 කින් ඉහළ ගිය අතර පංගු නොවන ඇඟළුම් අපනයන සියයට 23 කින් ඉහළ නැගුණි. එමෙන්ම, පංගු ක්‍රමය යටතේ වූ ඇඟළුම් නොවන අපනයන සියයට 19 කින් වැඩිවූ අතර පංගු ක්‍රමයට අයත් නොවන ඇඟළුම් නොවූ අපනයන සියයට 81 කින් වර්ධනය විය. යුරෝපා හවුලේ රටවල පංගු වෙන් කිරීම් ප්‍රමාණය සියයට 7 කින් ඉහළ නැංවුනු අතර පංගු උපයෝජනය සියයට 11 කින් වැඩිවිය. එමෙන්ම 1995 දී රෙදිපිළි සහ ඇඟළුම් මුළු අපනයන වටිනාකමේ රුපියල් අගය සියයට 24 කින් වර්ධනය විය. පංගු ක්‍රමයක් නොපවතින එහෙත් ඉහළ තරඟකාරිත්වයක් පවතින ජපන් සහ කොරියානු වෙළඳපළවල්වලට ඇතුළු වීමට ශ්‍රී ලංකා ඇඟළුම් අපනයනකරුවන්ට හැකි වීමද සඳහන් කළයුතු වැදගත් කරුණකි. සමස්ත වශයෙන්, පංගු නොවන අපනයන අයිතමයන් ප්‍රමාණය සියයට 43 සිට 50 දක්වා වැඩිවිය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයට අනුව ඇඟළුම් කම්හල් දෙසීය වැඩසටහන යටතේ වූ කර්මාන්තද ඇතුලත්ව ඇඟළුම් කම්හල් 629 ක් 1995 අවසානය වනවිට නිෂ්පාදන කටයුතුවල නියැලි සිටියහ. මෙම කර්මාන්තශාලා සෘජු රැකියා අවස්ථා 232,000 ක් සපයා ඇත. ඇඟළුම් කම්හල් දෙසීය වැඩසටහන යටතේ කම්හල් 160 ක් වාණිජ නිෂ්පාදනයෙහි නිරත වෙමින් පුද්ගලයින් 76,903 කට රැකියා අවස්ථා සලසා දී ඇත. 1995 දී මෙම ව්‍යවසායයන්ගේ අපනයන ඉපැයීම් ප්‍රමාණය රුපියල් බිලියන 32.9 ක් විය.

සංඛ්‍යා සටහන 4.3

## කාර්මික නිෂ්පාදන වටිනාකම 1991 - 1995
## (පවත්නා මිල ගණන් අනුව)

රුපියල් දශලක්ෂ

| | කාර්මික කාණ්ඩය | 1991 | 1992 | 1993 | 1994 | 1995 (අ) |
|---|---|---|---|---|---|---|
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 30,003 | 34,157 | 39,709 | 45,054 | 54,927 |
| 2 | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 33,854 | 53,929 | 70,057 | 78,211 | 89,944 |
| 3 | දැව හා දැව නිෂ්පාදිත | 802 | 1,005 | 1,230 | 1,601 | 1,929 |
| 4 | කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2,214 | 2,586 | 3,438 | 4,066 | 4,595 |
| 5 | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 20,140 | 23,817 | 28,876 | 34,017 | 38,321 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 8,181 | 10,582 | 12,351 | 14,580 | 16,740 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදිත | 1,264 | 1,424 | 1,497 | 1,909 | 1,736 |
| 8 | සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5,093 | 5,948 | 5,915 | 7,122 | 7,977 |
| 9 | අන්තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 2,373 | 2,658 | 3,402 | 4,083 | 5,271 |
| | එකතුව | 103,924 | 136,106 | 166,475 | 190,643 | 221,440 |

(අ) තාවකාලික

මූලයයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

1995 ජනවාරි මාසයේදී ජගත් වෙළඳ සංවිධානය (ජ.වෙ.සං.) පිහිටුවීමත් සමග "බහු විධ කෙඳි ගිවිසුම" යටතේ පැවති සියළු ද්විපාර්ශික රෙදිපිළි ගිවිසුම් උරුගුවේ ගිවිසුම ප්‍රකාර මත පිහිටවූ රෙදිපිළි සහ ඇඟළුම් ගිවිසුම යටතට පැවරුණි. රෙදිපිළි සහ ඇඟළුම් පිළිබඳ උරුගුවේ ගිවිසුම මගින් වසර 10 ක් තුලදී ක්‍රමිකව පංගු ක්‍රමය අහෝසි කර රෙදිපිළි සහ ඇඟළුම් අපනයන බහුවිධ වෙළඳ ක්‍රමයක් තුලට මුළුමනින්ම ඇතුලත් කර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කොට ඇත. මේ මගින් රෙදිපිළි සහ ඇඟළුම් සඳහා මුළුමනින්ම නිදහස් වෙළඳපළක් වසර 2005 දී නිර්මාණය කිරීමට බලාපොරොත්තු වේ. එමනිසා අනාගතයේදී පංගු වෙන්කිරීම මුළුමනින්ම අහෝසි කිරීමත් සමග ඇතිවන ප්‍රබල තරගකාරිත්වයට මුහුණ දීමට ශ්‍රී ලංකාව සූදානමින් සිටීම අතිශයෙන් වැදගත් කරුණකි.

සුරක්ෂිත අපනයන වෙළඳපලක් හිමි අපනයනය මුල්කොට ගත් රෙදිපිළි නිෂ්පාදන කර්මාන්ත 1995 දී සැලකියයුතු වර්ධනයක් වාර්තා කර ඇත. වර්ෂය තුළදී අපනයන මුල්කොට ගත් රෙදිපිළි නිෂ්පාදන කර්මාන්ත ගණනාවක් යුරෝපා ආර්ථික හවුලේ සහ මැද පෙරදිග රටවල කැට් නූල්, අමුරෙදි සහ නිමි රෙදි සඳහා වැඩි වූ ඉල්ලුම සපුරාලිය හැකිවන පරිදි ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාව ව්‍යාප්ත කිරීමේ හා කර්මාන්තශාලා නවීකරණය කිරීමෙහි යෙදුණි.

මේ අතර දේශීය වෙළඳපොල සඳහා රෙදිපිළි නිපදවූ ඇතැම් නිෂ්පාදකයන් මුහුණ දුන් අලෙවිකරණ ගැටළු හේතුවෙන් පසුබෑමකට ලක් විය. නීති විරෝධී මාර්ග තුලින් දේශීය වෙළඳපොලට ගලා ආ රෙදිපිළි මෙම ගැටළුවට අර්ධ වශයෙන් දායක විය. අතීතයේදී දැඩි ආරක්ෂිත ආවරණයක් සහිතව ක්‍රියාත්මක වූ මෙම අංශය තීරුබදු අඩුකිරීමෙන් ඇතිවූ තරගකාරිත්වය හමුවේ දැඩි පසුබෑමකට ලක්වුනි. ප්‍රධාන කර්මාන්ත ශාලා කිහිපයක ඇතිවූ කම්කරු ආරවුල්ද දේශීය රෙදි පිළි නිෂ්පාදන කර්මාන්තයට අයහපත් බලපෑමක් ඇති කිරීමට හේතුවිය. දැනට පවතින තත්ත්වය යටතේ දේශීය රෙදිපිළි කර්මාන්තය තරගකාරිත්වයට යොමු කිරීම සහ වියදම් අවම කිරීම සඳහා නවීන තාක්ෂණික සහ ක්‍රියාශීලි ආයෝජනයන් අවශ්‍ය වෙයි. යෝජිත වරායේදී සිදු කරන පූර්ව නැව්ගත කිරීම් පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීම දේශීය රෙදිපිළි කර්මාන්තයේ උන්නතිය සඳහා පිටුවහලක් වනු ඇත. මෙය රජයේ රේගු ආදායම ඉහළ යාමට ද හේතුවනු ඇත.

1995 දී සම් නිෂ්පාදනයන්හි සියයට 17 ක වර්ධනයක් පෙන්නුම් කලද පාවහන් උප අංශයෙහි සියයට 7 ක පහත වැටීමක් වාර්තා විය.

### ආහාර, පාන වර්ග සහ දුම්කොළ

දේශීය පාරිභෝගික ඉල්ලුම ඉහළ යෑම හේතුකොටගෙන ආහාර පාන වර්ග සහ දුම්කොළ උප අංශයේ නිෂ්පාදනය විමසුමට ලක් කරන වර්ෂය තුල තවදුරටත් ව්‍යාප්ත විය. මූර්ත වශයෙන් සියයට 10.5 කින් වර්ධනය වූ මෙම කාර්මික උප අංශයේ නිෂ්පාදනය මුළු කාර්මික නිෂ්පාදනයේ වර්ධනයෙන් සියයට 26 කට දායක විය. සකස් කළ දුම්කොළ සහ පාන වර්ග වන සී.ටී.සී. තේ සහ අසුරන ලද තේ මලු, තිරිඟු පිටි, කිරි නිෂ්පාදන, බිස්කට් සහ මාංශ නිෂ්පාදනවල නිමැවුම් මට්ටම් වල සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබුණි. විශේෂයෙන්ම තිරිඟු පිටි සහනාධාරය හේතුවෙන් තිරිඟු පිටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන දේශීය ඉල්ලුම ඉහළ යෑම එම අංශයේ ඉහළ ක්‍රියාකාරිත්වයට හේතු වූ අතර ඉහත සඳහන් කල ආකාරයට මෙම වර්ධනය ලබා ගැනීමට හැකි වූයේ කෘෂිකාර්මික අංශයට අහිතකර බලපෑමක් ඇති කිරීම තුලිනි.

කම්කරු ආරවුල් නිසා පසුගිය වර්ෂයේ සුළු පසුබෑමකට ලක්වුණු දුම්කොළ නිෂ්පාදන අංශයේ නිමැවුම 1995 වර්ෂයේදී යථාතත්ත්වයට පත්විය.විශේෂයෙන්ම වර්ෂයේ අග භාගයේදී අයථා පරිදි ගෙන්වන ලද විදේශීය සිගරට් සමඟ තරගයකට මුහුණ දීමට දේශීය සිගරට් කර්මාන්තයට සිදු විය. පසුගිය වර්ෂයේ ඇතිවුණු කම්කරු ආරවුල් හේතුවෙන් නිෂ්පාදන මට්ටම් පහත වැටුණු සත්ව ආහාර නිෂ්පාදනය, මෙම වර්ෂයේදී සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කල අතර මුළු වර්ෂය තුලම බාධාවකින් තොරව නිෂ්පාදන කටයුතු සිදුවිය. 1995 නොවැම්බර් මාසයේදී බීර සඳහා වන නිෂ්පාදන බදු අඩු කිරීම හේතුවෙන් දේශීය බීර නිෂ්පාදනයට උපරිම ධාරිතා මට්ටමට ළඟාවීමට වර්ෂය අග භාගයේදී හැකි විය.

### රසායනික නිෂ්පාදන, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත

පසුගිය වර්ෂයේදී සියයට 9.1 කින් වර්ධනය වූ ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත වල නිමැවුම් ප්‍රමාණය

## සංඛ්‍යා සටහන 4.4
# පංගු ලැබී ඇති ප්‍රමාණය සහ උපයෝජනය

| විස්තරය | ඒකක | ලැබී ඇති පංගු ප්‍රමාණය | | උපයෝජනය | | උපයෝජන ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | 1994 (අ) | 1995 (ආ) | 1994 (අ) | 1995 (ආ) | 1994 (අ) | 1995 (ආ) |
| **ඇමෙරිකා එක්සත් ජනපද පංගු** | | | | | | | |
| ක්‍රීඩා ඇඳුම් ආදිය | දුසිම් | 239,301 | 304,360 | 201,831 | 280,134 | 84.3 | 92.0 |
| පොප්ලින් රෙදි / බ්‍රෝඩ් ක්ලෝත් | ව.මී.ස. | 3,600,000 | 4,120,099 | 3,356,568 | 3,603,355 | 93.2 | 87.5 |
| අත්මේස් | දුසිම් | 5,878,186 | 5,327,848 | 5,878,186 | 5,120,332 | 100.0 | 96.1 |
| පිරිමි හා පිරිමි ළමුන්ගේ සූට්, කබා | දුසිම් | 23,700 | 2,605 | 5 | 0 | 0.0 | 0.0 |
| පිරිමිහා පිරිමි ළමුන්ගේ සූට්නොවන කබා | දුසිම් | 729,133 | 615,833 | 729,133 | 527,869 | 100.0 | 85.7 |
| ගැහැණු සහ ගැහැණු ළමුන්ගේ කබා | දුසිම් | 272,081 | 283,781 | 272,081 | 197,320 | 100.0 | 69.5 |
| ඇඳුම් | දුසිම් | 499,328 | 572,566 | 499,328 | 589,817 | 100.0 | 103.0 |
| ගොතන ලද කමිස සහ හැට්ට | දුසිම් | 1,244,751 | 1,388,284 | 1,099,519 | 1,303,179 | 88.3 | 93.9 |
| ගැහැණු, සහ ගැහැණු ළමුන්ගේ නොගෙතූ කමිස සහ හැට්ට | දුසිම් | 1,232,439 | 1,253,654 | 1,170,802 | 894,974 | 95.0 | 71.4 |
| පිරිමි සහ පිරිමි ළමුන්ගේ නොගෙතූ කමිස | දුසිම් | 1,136,441 | 1,346,490 | 1,136,441 | 1,185,016 | 100.0 | 88.0 |
| ගැහැණු, සහ ගැහැණු ළමුන්ගේ නොගෙතූ කමිස සහ බ්ලවුස් | දුසිම් | 1,769,513 | 1,930,467 | 1,753,318 | 1,289,444 | 99.1 | 66.8 |
| සාය | දුසිම් | 442,964 | 584,835 | 290,336 | 730,985 | 65.5 | 125.0 |
| ස්විටර්ස් | දුසිම් | 96,475 | 140,563 | 77,111 | 77,883 | 79.9 | 55.4 |
| දිග කලිසම් ආදිය | දුසිම් | 1,506,969 | 1,557,838 | 1,506,969 | 1,491,071 | 100.0 | 95.7 |
| මසන ලද ගවුම් | දුසිම් | 56,875 | 116,046 | 56,875 | 65,314 | 100.0 | 56.3 |
| රාත්‍රි ඇඳුම් | දුසිම් | 321,783 | 373,596 | 310,753 | 324,940 | 96.6 | 87.0 |
| යට ඇඳුම් | දුසිම් | 1,148,395 | 1,246,213 | 1,145,719 | 1,215,823 | 99.8 | 97.6 |
| ආවරණ කබා | කි. ග්‍රෑ. | 866,644 | 1,343,928 | 669,973 | 1,144,057 | 77.3 | 85.1 |
| කොට්ට උර | දුසිම් | 88,398 | 126,049 | 88,398 | 65,453 | 100.0 | 51.9 |
| තුවා සහ අනෙකුත් සිනිදු තුවා | දුසිම් | 555,966 | 349,552 | 279,723 | 362,316 | 50.3 | 103.7 |
| අත් පිස්නා | කි. ග්‍රෑ. | 635,404 | 624,518 | 180,643 | 233,184 | 28.4 | 37.3 |
| සාප්පු තුවා | කි. ග්‍රෑ. | 614,081 | 487,779 | 462,115 | 336,790 | 75.3 | 69.0 |
| පිරිමි සහ පිරිමි ළමුන්ගේ සූට් නොවන කබා | දුසිම් | 6,221 | 7,860 | 0 | 513 | 0.0 | 6.5 |
| ගැහැණු සහ ගැහැණු ළමයින්ගේ කබා | දුසිම් | 15,750 | 15,933 | 15,135 | 7,093 | 96.1 | 44.5 |
| ගැහැණු සහ ගැහැණු ළමයින්ගේ නොගෙතූ කමිස සහ බ්ලවුස් | දුසිම් | 8,887 | 11,735 | 0 | 4,325 | 0.0 | 36.9 |
| වියන ලද රෙදි | ව.මී.ස. | 4,147,017 | 5,310,564 | 2,602,347 | 1,610,683 | 62.8 | 30.3 |
| ගැහැණු සහ ගැහැණු ළමයින්ගේ කබා | දුසිම් | 389,586 | 383,861 | 389,586 | 315,834 | 100.0 | 82.3 |
| ගොතන ලද කමිස | දුසිම් | 668,827 | 84,546 | 505,416 | 692,407 | 75.6 | 81.7 |
| ගැහැණු සහ ගැහැණු ළමයින්ගේ නොගෙතූ කමිස සහ බ්ලවුස් | දුසිම් | 1,141,088 | 1,207,271 | 624,162 | 394,470 | 54.7 | 32.7 |
| ළමයින්ගේ සූට් | දුසිම් | 17,381 | 21,406 | 4,151 | 3,758 | 23.8 | 17.6 |
| ස්වීටර්ස් | දුසිම් | 25,943 | 87,331 | 7,219 | 953 | 28.8 | 1.1 |
| දිග කලිසම් ආදිය | දුසිම් | 669,747 | 991,211 | 637,802 | 671,771 | 95.2 | 67.8 |
| නොගෙතූ කමිස සහ බ්ලවුස් | දුසිම් | 230,884 | 157,671 | 230,884 | 146,471 | 100.0 | 92.9 |
| **යුරෝපා හවුලේ පංගු** | | | | | | | |
| පිරිමි හා කාන්තා දිග කලිසම් සහ පිරිමි කොට කලිසම් | කැලි | 5,882,172 | 6,732,021 | 5,201,255 | 6,801,927 | 88.42 | 101.04 |
| කාන්තා හා ගැහැණු ළමුන්ගේ ගොතන ලද බ්ලවුස් | කැලි | 11,355,160 | 11,721,360 | 11,161,138 | 11,800,567 | 98.29 | 100.68 |
| පිරිමි හා පිරිමි ළමුන්ගේ වියන ලද කමිස | කැලි | 8,151,072 | 8,242,000 | 7,694,681 | 7,669,036 | 94.40 | 93.05 |
| වියන ලද විවිධ වර්ගයේ උණුසුම් ඇඳුම් | කැලි | 6,789,610 | 7,675,983 | 2,859,067 | 3,602,337 | 42.11 | 46.93 |
| **කැනඩාවේ පංගු** | | | | | | | |
| කබා හැට්ට සහ වැහි කබා | කැලි | 888,061 | 894,492 | 752,950 | 757,412 | 84.79 | 84.68 |
| ජ්වායින් කබා | කැලි | 111,618 | 113,836 | 56,448 | 47,982 | 50.57 | 42.15 |
| හිම කබා | කැලි | 219,883 | 210,159 | 219,883 | 207,099 | 100.00 | 98.54 |
| පිරිමි සිනිඳු ඇඳුම් | | | | | | | |
| ගැහැණු සිනිඳු ඇඳුම් | කැලි | 768,395 | 800,729 | 344,443 | 483,536 | 44.83 | 60.39 |
| සිනිඳු ඇඳුම් | කැලි | 23,532 | 25,297 | 0 | 0 | 0.00 | 0.00 |
| දිග සහ කොට කලිසම් | කැලි | 794,081 | 853,638 | 525,076 | 669,101 | 6.12 | 78.38 |
| මසන ලද කමිස | කැලි | 708,598 | 761,742 | 576,047 | 504,825 | 81.29 | 66.27 |
| ටී ෂර්ට් ස්විටර්ස්, ක්‍රීඩා ඇඳුම් | කැලි | 1,451,648 | 911,808 | 994,279 | 447,930 | 68.49 | 49.13 |
| ගොතන ලද සහ වියන ලද බ්ලවුස් සහ කමිස | කැලි | 664,751 | 644,100 | 664,759 | 669,984 | 100.00 | 104.02 |
| යට ඇඳුම් | කැලි | 1,013,543 | 1,130,232 | 845,182 | 344,893 | 83.39 | 30.52 |
| නිදන ඇඳුම් සහ නාන කබා | කැලි | 588,300 | 632,423 | 345,156 | 106,417 | 58.67 | 16.83 |
| ස්විටර්ස් | කැලි | 186,686 | 112,867 | 18,744 | 42,377 | 10.04 | 37.55 |
| පිහිනුම් ඇඳුම් | කැලි | 503,366 | 632,423 | 99,199 | 159,041 | 19.71 | 25.15 |
| ළදරු ඇඳුම් | කැලි | 294,150 | 316,211 | 98,107 | 212,584 | 33.35 | 67.23 |
| ඇඳ ඇතිරිලි | කැලි | 543,008 | 658,374 | 34,052 | 179,217 | 6.27 | 27.22 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

1995 වර්ෂයේදී සියයට 6.6 කින් වර්ධනය විය. වර්ධනයේ මෙම පහත වැටීමට හේතු වූයේ නඩත්තු කටයුතු සඳහා ඛනිජ තෙල් සංස්ථාවේ පිරිපහදුව තාවකාලිකව වසා තිබීමයි. යුරෝපා ආර්ථික හවුලේ සහ මැදපෙරදිග රටවලින් පැවති ආනයන ඉල්ලුම ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ටයර්, ටියුබ් සහ රබර් අත්වැසුම්, පොලි බෑග්, රබර් බෑග්, රබර් මිශ්‍රිත මෙට්ට, පී.වී.සී. බෑග් සහ පී.වී.සී. වැහිකබා වැනි රබර් නිෂ්පාදිත සැලකියයුතු ලෙස වර්ධනය විය. දේශීය නිෂ්පාදිතවල ගුණාත්මක තත්ත්වය ඉහළ මට්ටමක පැවතීම සහ ආනයනික භාණ්ඩවලට වඩා මිල අඩුවීමේ හේතුවෙන් ඇති වූ ඉහළ ඉල්ලුම සබන් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය, ඖෂධ වර්ග, කෘෂි රසායනික සහ ප්ලාස්ටික් නිෂ්පාදිත යන අංශ වල නිමැවුම සැලකිය යුතු ලෙස වර්ධනය වීමට හේතුවිය.

## අනෙකුත් කාර්මික නිෂ්පාදිත

1995 දී ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත කාණ්ඩයේ සියයට 7.5ක වර්ධන අනුපාතයක් ලබා ගැනීමට ඩොලමයිට් නිෂ්පාදන, පෝසිලේන් ප්‍රතිමා සහ කුට්ටි කරන ලද කළුගල් සඳහා ඉහළ ගිය අපනයන ඉල්ලුම දායක විය. කපා ඔප දමන ලද දියමන්ති කර්මාන්තයේ නියැලුනු සමහර කර්මාන්ත ආයතනවල කම්කරු ආරවුල් තිබියදීත්, මෙම කර්මාන්තයට 1995 වර්ෂයේදී සියයට 4 ක වර්ධනයක් ලබා ගැනීමට හැකි විය. වීදුරු නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදන අංශයෙහි සැලකියයුතු වර්ධනයක් සිදු වී ඇත. ඉදිකිරීම් කර්මාන්තය වෙතින් මෙම භාණ්ඩ සඳහා වූ දේශීය ඉල්ලුම ඉහළයාම මෙම අංශයෙහි වර්ධනයට විශාල වශයෙන් හේතු විය. ඉහළ ඉල්ලුමක් තිබියදීත් රුහුණු සිමෙන්ති කර්මාන්තශාලාව සම්බන්ධව අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී සිදුවූ ප්‍රමාදයන්, සිමෙන්ති නිෂ්පාදනයේ ආන්තික අඩුවීමක් වාර්තා වීමට හේතු විය. කම්කරු ආරවුල් හේතුවෙන් 1994 වර්ෂයේදී පහත වැටුණු පිහන් ආශ්‍රිත නිෂ්පාදනවල ආන්තික වැඩිවීමක් 1995 වර්ෂයේදී දක්නට ලැබුණි.

කඩදාසි හා කඩදාසි නිෂ්පාදන කාර්මික කාණ්ඩයෙහි නිමැයුම සියයට 1.6 ක අඩුවීමක් වාර්තා කළේය. මෙම අඩුවීම ලංකා කඩදාසි සංස්ථාවේ නිෂ්පාදනය සියයට 10 කින් පහත වැටීමේ ප්‍රතිඵලයකි. කෙසේ වුවද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට යටත් නොවන පෞද්ගලික අංශයේ මුද්‍රණ කටයුතු, කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සහ ලේබල් නිෂ්පාදනය සියයට 14 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ පුළුල් වන කර්මාන්ත හා සේවා අංශයෙන් මෙම අයිතමයන් සඳහා වූ දේශීය ඉල්ලුම වැඩි වීමයි.

සකස් කළ ලෝහ නිෂ්පාදිත කාර්මික කාණ්ඩයේ නිමැයුමෙහි සියයට 3.5 සුළු වැඩිවීමක් වාර්තා විය. මෙම කාර්මික කාණ්ඩයෙහි ඉහළ වර්ධන වේගයක් වාර්තා කළ නිෂ්පාදිතයන් වූයේ සකස් කළ ලෝහ, බැටරි, විදුලි බුබුළු, කේබල් සහ කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර යනාදියයි. ඉකුත් වර්ෂයේදීද ඉහළ වර්ධනයන් වාර්තා කළ බස් සහ ලොරි බොඩි සකස් කිරීමේ නියැලුනු කර්මාන්ත, 1995 දී දේශීය ඉල්ලුම වැඩිවීම නිසා තවදුරටත් පුළුල් විය.

අනෙකුත් කර්මාන්ත අතරින් සාමාන්‍ය නිමැවුම් වර්ධන අනුපාතයන් වාර්තා කල කර්මාන්තයන් වූයේ, කොහු කෙඳි නිෂ්පාදිත, ධීවර ආම්පන්න සහ නයිලෝන් දැල් යනාදියයි. ඉහළ අපනයන ඉල්ලුම, සැහැල්ලු සෙල්ලම් බඩු නිෂ්පාදන කර්මාන්තය ප්‍රසාරණය වීමට ප්‍රධාන හේතුව විය.

ආයෝජන මණ්ඩලය යටතේ ඇති කර්මාන්තයන්හි නිෂ්පාදන ප්‍රවනතාව අපනයන ක්‍රියාකාරිත්වය මත ඇස්තමේන්තු කර ඇත. වාසි සහගත විදේශ ඉල්ලුමට අමතරව ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ පසුගිය වර්ෂ කිහිපය තුළදී අනුමත කරන ලද අපනයන පෙරදැරි කරගත් කර්මාන්ත සංඛ්‍යාව ඉහළයාම සහ පවත්නා කර්මාන්තවල ධාරිතාවය පුළුල් කිරීම මෙම අංශයේ වර්ධනයට හේතු විය. ආයෝජන මණ්ඩලය යටතට එන කර්මාන්තවල නිමැවුම 1994 පැවති මට්ටමට වඩා මූර්ත වශයෙන් සියයට 16 ක වැඩිවීමක් 1995 දී වාර්තා කර ඇත. ඇහළුම් කම්හල් දෙසිය වැඩසටහන ද ඇතුලත්ව ආයෝජන මණ්ඩලය යටතේ එන ව්‍යවසායයන්හි දළ අපනයන ඉපැයුම් ප්‍රමාණය 1994 දී පැවති රුපියල් බිලියන 88 (විගැහි දශලක්ෂ 1,244) සිට 1995 දී රුපියල් බිලියන 113

සටහන 4.5

### රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය 1991 - 1995

| කාර්මික කාණ්ඩය | 1991 | 1992 | 1993 | 1994 | 1995 (අ) |
|---|---|---|---|---|---|
| 1 ආහාර පාන වර්ග සහ දුම්කොළ | 18.3 | 13.4 | 8.1 | 9.3 | 10.5 |
| 2 රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 66.6 | 27.5 | 10.3 | - | - |
| 3 දැව හා දැව නිෂ්පාදිත | 12.3 | 20.3 | 25.4 | 22.0 | 26.7 |
| 4 කඩදසි සහ කඩදාසි නිෂ්පාදිත | 137.4 | 156.6 | 174.1 | 187.8 | 169.2 |
| 5 රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 111.9 | 86.9 | 121.8 | 126.3 | 115.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 131.1 | 91.8 | 129.4 | 134.2 | 123.1 |
| 6 ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 143.5 | 143.4 | 120.0 | 5.5 | 5.4 |
| 7 මූලික ලෝහ නිෂ්පාදිත | 111.5 | 125.7 | 92.4 | 130.8 | 95.0 |
| 8 සකස් කළ ලෝහ නිෂ්පාදිත | 17.4 | - | - | - | - |
| සියළුම කාණ්ඩයන් | 91.6 | 73.3 | 87.9 | 83.8 | 76.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර | 67.6 | 52.7 | 41.7 | 27.7 | 24.1 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(විගැහි දශලක්ෂ 1,453) දක්වා සියයට 28 කින් වර්ධනය විය. ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවසායයන් අතුරින් වර්ධනයන් වාර්තා කල කර්මාන්ත උප අංශයන් වූයේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ (සියයට 23), රෙදිපිළි, ඇඳුම්, පැළඳුම් හා සම් නිෂ්පාදිත (සියයට 13), දැව සහ දැව නිෂ්පාදිත (සියයට 65), රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 40), ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 24), සකස් කල ලෝහ නිෂ්පාදිත, (සියයට 85) සහ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත, (සියයට 27) යනාදියයි.

මූර්ත වටිනාකම අනුව, 1994 වර්ෂයේදී සියයට 5 කින් පහත වැටුණු රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම් වටිනාකම 1995 වර්ෂයේදී සියයට 9 කින්, තවදුරටත් පහත වැටිණි. වර්ෂය මුලදී තෙල් පිරිපහදුව නඩත්තු කටයුතු සඳහා තාවකාලිකව වසා දැමීම රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදනයෙන් සියයට 85 කට දායක වූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිෂ්පාදනය, 1995 දී සැලකිය යුතු ලෙස පහත වැටීමට (සියයට 8 කින්) ප්‍රධාන වශයෙන් හේතුවිය. ඛනිජ තෙල් නිෂ්පාදනය අත්හල විටද රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදනය සියයට 13 කින් පහත වැටී ඇත.

1995 වර්ෂයේදී නිෂ්පාදන වර්ධනයන් වාර්තා කල රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් වූයේ සීමාසහිත ලංකා ලුණු සමාගම (සියයට 78 කින්), රාජ්‍ය දැව සංස්ථාව (සියයට 20 කින්), සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (සියයට 12 කින්), සීමාසහිත ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව (සියයට 10කින්) සහ සීමාසහිත සෙවනගල සීනි කර්මාන්ත සමාගම (සියයට 1 කින්) යන ඒවාය.

වර්ෂය මුළුල්ලේ පැවතුණු යහපත් කාලගුනික තත්ත්වයන් සහ නවීන යන්ත්‍ර හා පොම්ප භාවිතය, සීමාසහිත ලංකා ලුණු සමාගමේ නිෂ්පාදනය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් දායක විය. සීමාසහිත ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාවේ නිෂ්පාදන වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ කේද්‍රාපසාරීන්වයට භාජනය කරන ලද රබර් කිරි සඳහා පැවති ඉහළ ඉල්ලුම වේ.

වර්ෂය තුලදී නිෂ්පාදන පහත වැටීම් වාර්තා කල රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් වූයේ සීමාසහිත ලංකා වානේ සංස්ථාව (සියයට 27 කින්), සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම (සියයට 19 කින්), ලංකා ඛනිජ තෙල් සංස්ථාව (සියයට 8 කින්) සහ සීමාසහිත ජාතික කඩදාසි සමාගම (සියයට 10 කින්) යන ඒවාය.


අමුද්‍රව්‍ය සැපයුම ප්‍රමාණවත් නොවීම, කම්කරු ආරවුල් සහ නඩත්තු කටයුතු සඳහා කර්මාන්තශාලාව වසා තිබීම සීමාසහිත ලංකා වානේ සංස්ථාවේ නිෂ්පාදනය පහත වැටීමට හේතු විය. අමුද්‍රව්‍ය කැනීම් මට්ටම අඩුවීම නිසා ඇති වූ අමුද්‍රව්‍ය හිඟය සීමාසහිත ලංකා ඛනිජවැලි සමාගමේ නිෂ්පාදනය පහත වැටීමට හේතු විය. සීමාසහිත ජාතික කඩදාසි සමාගමෙහි නිෂ්පාදනය පහත වැටීමට විශාල ලෙස හේතු වූයේ අමුද්‍රව්‍ය සැපයුම හිඟකම සහ වාලච්චේනේ කර්මාන්තශාලාවහි පැවති විදුලිය ඇණහිටීමය.

රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් ආංශික වර්ගීකරණය අනුව සලකා බැලීමේදී දැව හා දැව නිෂ්පාදිත කාණ්ඩය සියයට 21 කින්ද, ආහාර, පාන වර්ග හා දුම්කොළ කාණ්ඩය සියයට 13 කින්ද වර්ධනය වී ඇත. නිෂ්පාදන පහත වැටීම් වාර්තා කළ කාර්මික කාණ්ඩයන් වූයේ, මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 27 කින්), කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 10 කින්), රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්,රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 8 කින්) සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 2 කින්) යන ඒවාය.

## 4.3 එකතු වූ අගය

පවත්නා මිල ගණන් අනුව, පසුගිය වර්ෂයේ සියයට 15 කින් වර්ධනය වූ කර්මාන්ත අංශයේ එකතු වූ අගය 1995 දී සියයට 17 කින් වර්ධනය විය. මෙය කර්මාන්ත ශාලාවෙන්

රූප සටහන 4.2
කාර්මික නිෂ්පාදනයේ එකතු වූ අගය




පිටවන නිමැයුමේ වටිනාකම ඉහළ යාමේ ප්‍රතිඵලයකි. මූර්ත වටිනාකම අනුව කර්මාන්තයන්හි එකතු වූ අගයේ වර්ධනය සියයට 10 ක් විය.

1995 දී නිෂ්පාදන කර්මාන්තවල එකතු වූ අගයෙහි සමස්ත වටිනාකම රුපියල් බිලියන 82 ක් විය. එකතු වූ අගය, නිෂ්පාදන වටිනාකමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 1995 වර්ෂයේදී සියයට 37 ක් වූ අතර එය පසුගිය වර්ෂයේ පැවති අගය හා සමාන විය. සියයට 50 කට වඩා වැඩි එකතු වූ වටිනාකම් අනුපාතයක් පැවති නිෂ්පාදන කාණ්ඩයන් වූයේ දැව හා දැව නිෂ්පාදන (සියයට 67), ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (සියයට 65), සකස් කළ ලෝහ නිෂ්පාදන (සියයට 61), කඩදාසි හා කඩදාසි නිෂ්පාදනය (සියයට 57) සහ ආහාර,පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන (සියයට 54) ය. මෙම අනුපාතය සියයට 50 ට අඩු වූ කාර්මික කාණ්ඩයන් වූයේ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදන (සියයට 42), රෙදිපිළි ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පදන (සියයට 26), මූලික ලෝහ නිෂ්පාදන (සියයට 17) සහ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන (සියයට 16) යනාදියයි

සංඛ්‍යා සටහන 4.6

**කර්මාන්ත අංශයේ එකතු වූ අගය 1991 - 1995**

**(පවත්නා මිල ගණන් අනුව)**

රුපියල් දශලක්ෂ

| | කාර්මික කාණ්ඩය | 1991 | 1992 | 1993 | 1994 | 1995 (අ) |
|---|---|---|---|---|---|---|
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 15,070 | 18,668 | 21,704 | 24,373 | 29,935 |
| 2 | රෙදිපිළි, ඇඳුම් පැළඳුම්, සහ සම් නිෂ්පාදිත | 8,542 | 14,630 | 18,994 | 20,660 | 23,385 |
| 3 | දැව හා දැව නිෂ්පාදිත | 571 | 677 | 831 | 1,081 | 1,292 |
| 4 | කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 1,167 | 1,397 | 1,912 | 2,301 | 2,600 |
| 5 | රසායනික ද්‍රව්‍ය ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 3,199 | 3,989 | 4,723 | 5,758 | 6,515 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 4,905 | 5,918 | 7,163 | 9,272 | 10,546 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදිත | 248 | 263 | 279 | 356 | 324 |
| 8 | සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 3,247 | 3,629 | 3,608 | 4,344 | 4,865 |
| 9 | අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 1,092 | 1,196 | 1,532 | 1,838 | 2,373 |
| | එකතුව | 38,041 | 50,367 | 60,746 | 69,983 | 81,836 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 4.4 ණය සහ අනෙකුත් යෙදවුම්

### ණය

ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ආසියානු සංවර්ධන බැංකුව ඒකාබද්ධව අරමුදල් සැපයූ, ජාතික සංවර්ධන බැංකුව මගින් ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ව්‍යාපෘති සඳහා වන ණය යෝජනා ක්‍රමය (සුමක) මගින් කර්මාන්ත අංශයේ මධ්‍යම හා දිගුකාලීන ණය අවශ්‍යතාවයන් තවදුරටත් සපුරාලන ලදි. මෙය 1995 වර්ෂය තුල කර්මාන්තවලට මූල්‍ය ආධාර ලැබුණු ප්‍රධාන ණය වැඩසටහන විය. මෙයට අමතරව ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව (ලං.සං.මූ.ස.), ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) සහ අනෙකුත් වාණිජ බැංකු මගින් කර්මාන්ත අංශය සඳහා ණය වශයෙන් සහ ප්‍රාග්ධන සහභාගිත්වය තුලින් සෘජු මූල්‍ය පහසුකම් සපයන ලදි.

ජාතික සංවර්ධන බැංකුව 1994 දී රුපියල් දශලක්ෂ 5,417 ක සෘජු මූල්‍ය ආධාර සපයමින් අනුමත කරන ලද ව්‍යාපෘති 352 හා සැසඳීමේදී 1995 දී රුපියල් දශලක්ෂ 6,519 ක සෘජු මූල්‍ය ආධාර සපයමින් ව්‍යාපෘති 431 ක් අනුමත කරන ලදි. තවද ජාතික සංවර්ධන බැංකුව 1995 වර්ෂය තුලදී ව්‍යාපෘති 10 ක් සඳහා රුපියල් දශලක්ෂ 477 ක ප්‍රාග්ධන දායකත්වයක් සැපයීය. මෙම ණය පහසුකම් වලින් වැඩි කොටසක් ලබාගත් කාර්මික කාණ්ඩයන් වූයේ ආහාර, පාන වර්ග හා දුම්කොළ, සකස් කළ ලෝහ, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත, රෙදිපිළි, ඇඳුම් පැළඳුම්

සංඛ්‍යා සටහන 4.7

**1995 දී ජාතික සංවර්ධන බැංකුව සහ ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය විසින් සපයා ඇති මූල්‍ය පහසුකම් - 1995**

| කාර්මික කාණ්ඩය | ජා. සං. බැං. | | | | | | | | ල. ස. මූ. ස. | | | | | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් IV සු.ම.ක. යෝජනා ක්‍රමය | | සෘජු මූල්‍ය පහසුකම් | | ප්‍රාග්ධන සහභාගිත්වය | | එකතුව | | ණය අනුමත කිරීම් | | ප්‍රාග්ධන සහභාගිත්වය | | එකතුව | | | |
| | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ |
| 1. ආහාර පාන වර්ග සහ දුම්කොළ | 254 | 164 | 43 | 1,025 | - | - | 297 | 1,189 | 134 | 1,127 | - | - | 134 | 1,127 | 431 | 2,316 |
| 2. රෙදිපිළි ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 97 | 72 | 54 | 510 | 3 | 86 | 154 | 668 | 83 | 398 | 4 | 35 | 87 | 433 | 241 | 1,101 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 72 | 42 | 7 | 79 | - | - | 79 | 121 | 38 | 98 | - | - | 38 | 98 | 117 | 219 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 66 | 76 | 11 | 59 | - | - | 77 | 135 | 31 | 182 | - | - | 31 | 182 | 108 | 317 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 63 | 94 | 32 | 560 | - | - | 95 | 654 | 78 | 790 | 1 | 5 | 79 | 795 | 174 | 1,449 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | - | - | 40 | 391 | - | - | 40 | 391 | 26 | 155 | 2 | 56 | 28 | 211 | 68 | 602 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 96 | 91 | - | - | - | - | 96 | 91 | 8 | 28 | - | - | 8 | 28 | 104 | 119 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත | 465 | 259 | 71 | 813 | 3 | 112 | 539 | 1,184 | 74 | 535 | 1 | 15 | 75 | 550 | 614 | 1,734 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 730 | 637 | 173 | 3,082 | 4 | 279 | 907 | 3,998 | - | - | - | - | - | - | 907 | 3,998 |
| එකතුව | 1,843 | 1,435 | 431 | 6,519 | 10 | 477 | 2,284 | 8,431 | 472 | 3,313 | 8 | 111 | 480 | 3,424 | 2,764 | 11,855 |

මූලයයන් : ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය
ජාතික සංවර්ධන බැංකුව

**සංඛ්‍යා සටහන 4.8**

## කර්මාන්තයන්හි භාවිතාකළ අමුද්‍රව්‍ය වටිනාකම 1991 - 1995

රුපියල් දශලක්ෂ

| කාර්මික කාණ්ඩය | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) |
|---|---|---|---|---|---|
| 1 ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 13,432 | 14,768 | 17,869 | 17,978 | 20,872 |
| 2 රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදන | 23,280 | 33,223 | 43,435 | 53,640 | 60,498 |
| 3 දැව හා දැව නිෂ්පාදිත | 199 | 258 | 320 | 408 | 522 |
| 4 කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 671 | 827 | 1,100 | 1,196 | 1,351 |
| 5 රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 16,740 | 17,589 | 23,678 | 27,579 | 30,618 |
| 6 ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 1,558 | 2,194 | 2,841 | 2,684 | 3,081 |
| 7 මූලික ලෝහ නිෂ්පාදිත | 890 | 969 | 1,012 | 1,305 | 1,187 |
| 8 සකස්කල ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 1,642 | 1,903 | 1,893 | 2,279 | 2,544 |
| 9 අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 902 | 983 | 1,327 | 1,510 | 1,950 |
| එකතුව | 59,314 | 72,714 | 93,475 | 108,579 | 122,623 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

හා සම් නිෂ්පාදන සහ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදන යන කාර්මික කාණ්ඩයන්ය.

1994 වර්ෂය තුලදී සුළු අඩුවීමක් පෙන්නුම් කළ ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව මගින් ලබාදුන් ණය සහ ප්‍රාග්ධන සහභාගිත්වයෙහි කැපී පෙනෙන වර්ධනයක් 1995 වර්ෂය තුලදී පෙන්නුම් කරන ලදී. ලං.සං.මූ.ස. 1994 දී අනුමත කරන ලද රුපියල් දශලක්ෂ 2,501 ක ණය ප්‍රදාණයන් කල අනුමත කල ව්‍යාපෘති 311 හා සැසඳීමේදී, 1995 දී රුපියල් දශලක්ෂ 3,424 ක ණය ප්‍රදානයන් සහිත ව්‍යාපෘති 480 අනුමත කරන ලදී. මෙම මූල්‍ය පහසුකම් වලින් ප්‍රධාන කොටසක් ලබාගත් කාර්මික කාණ්ඩයන් වූයේ ආහාර, පාන වර්ග හා දුම්කොළ; රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ නිෂ්පාදිතයන්ය.

1995 වර්ෂය තුලදී වාණිජ බැංකු ද කර්මාන්ත අංශය සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම නොකඩවා කරගෙන යනු ලැබිය. 1995 වර්ෂයේ මුල් මාස නවය තුලදී කාර්මික අංශයට සැපයුණු වාණිජ බැංකු අත්තිකාරම්වල සියයට 25 ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, 1994 දෙසැම්බර් අවසානයේදී පැවති රුපියල් බිලියන 19.5 සිට 1995 සැප්තැම්බර් අවසානයේදී රුපියල් බිලියන 24.5 දක්වා ඉහළ ගියේය. වාණිජ බැංකු මගින් 1994 මුල් කාර්තු 3 තුළ කර්මාන්ත අංශයට ලබාදුන් ණය ප්‍රමාණයෙහි වර්ධනය සියයට 6 ක් විය.

### අමුද්‍රව්‍ය

1994 වර්ෂයේ රුපියල් බිලියන 109 ක් වූ නිමැවුම් අංශයේ කර්මාන්තවලට යෙදවූ අමුද්‍රව්‍යවල මුළු නාමික වටිනාකම, සියයට 13 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1995 වර්ෂයේදී රුපියල් බිලියන 123 ක් විය. විශාලතම පිරිවැය වැඩිවීම වාර්තා කරනු ලැබුයේ දැව හා දැව නිෂ්පාදිත සහ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත යන කාර්මික කාණ්ඩයන්හිය. මුළු කර්මාන්ත නිෂ්පාදන වටිනාකමින් අමුද්‍රව්‍ය පිරිවැය සංයුතිය ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන කාණ්ඩයෙහි වූ සියයට 18 සිට රසායනික ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි සියයට 80 දක්වා වූ පරාසයක පැවතිණ. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත කාණ්ඩයෙහි අමුද්‍රව්‍ය පිරිවැය සංයුතිය සියයට 67 ක් විය. 1995 වර්ෂයේ මුළු කර්මාන්ත නිෂ්පාදිතයේ වටිනාකමෙන් අමුද්‍රව්‍යවල වියදම සියයට 55 ක් විය. 1995 වර්ෂය තුළ පෞද්ගලික අංශයේ රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයන්හි අමුද්‍රව්‍ය වියදම් ඉහළ යාම් විශාල වශයෙන් දක්නට ලැබුණි. මීට මූලික හේතුව වූයේ ස්වාභාවික රබර්, කෘත්‍රිම රබර් සහ නයිලෝන් ආදියේ ජාත්‍යන්තර මිල ගණන්වල කැපී පෙනෙන ඉහළ යාමය.

**සංඛ්‍යා සටහන 4.9**

## කර්මාන්තයන්හි භාවිතාකළ බලය හා ඉන්ධන වටිනාකම 1991 - 1995

රුපියල් දශලක්ෂ

| කාර්මික කාණ්ඩය | 1991 | 1992 | 1993 | 1994 | 1995 (අ) |
|---|---|---|---|---|---|
| 1 ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 1,500 | 2,049 | 2,383 | 2,703 | 3,296 |
| 2 රෙදිපිළි, ඇඳුම් පැළඳුම්, සහ සම් නිෂ්පාදිත | 2,031 | 2,446 | 3,503 | 3,911 | 4,515 |
| 3 දැව හා දැව නිෂ්පාදිත | 32 | 70 | 86 | 112 | 135 |
| 4 කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 376 | 362 | 481 | 569 | 643 |
| 5 රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 201 | 212 | 578 | 680 | 765 |
| 6 ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 1,718 | 1,781 | 2,223 | 2,624 | 3,013 |
| 7 මූලික ලෝහ නිෂ්පාදිත | 126 | 184 | 193 | 248 | 226 |
| 8 සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 204 | 416 | 414 | 499 | 556 |
| 9 අන් තැනෙක සඳහන් නොවූ නිෂ්පාදිත | 380 | 478 | 612 | 735 | 949 |
| එකතුව | 6,568 | 7,998 | 10,473 | 12,081 | 14,098 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංඛ්‍යා සටහන 4.10

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් විසින් දැනට කර ඇති ආයෝජන (අ)

| | කාණ්ඩය | ව්‍යවසායයන් ගණන | | විදේශ ආයෝජන (රු. දශලක්ෂ) | | මුළු ආයෝජන (ආ) (රු. දශලක්ෂ) | |
|---|---|---|---|---|---|---|---|
| | | 1994 | 1995 (ඇ) | 1994 | 1995 (ඇ) | 1994 | 1995 (ඇ) |
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 43 | 53 | 667 | 1,290 | 1,183 | 1,974 |
| 2 | රෙදිපිළි ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 101 | 109 | 11,585 | 11,064 | 12,675 | 12,821 |
| 3 | දැව හා දැව නිෂ්පාදිත | 15 | 17 | 449 | 488 | 479 | 551 |
| 4 | කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 7 | 9 | 167 | 167 | 270 | 362 |
| 5 | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 50 | 52 | 4,687 | 4,945 | 5,193 | 5,633 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 38 | 39 | 652 | 774 | 2,189 | 2,346 |
| 7 | සකස්කළ ලෝහ නිෂ්පාදිත | 16 | 19 | 472 | 615 | 621 | 978 |
| 8 | අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 79 | 91 | 2,981 | 2,919 | 3,635 | 4,068 |
| 9 | සේවා | 165 | 217 | 20,221 | 28,108 | 33,564 | 43,487 |
| | එකතුව | 514 | 606 | 41,881 | 50,370 | 59,809 | 72,219 |

(අ) වර්ෂය අවසානයේදී පැවති සංඛ්‍යාව
(ආ) ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති
(ඇ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## බලය සහ ඉන්ධන

1995 වර්ෂය තුලදී කර්මාන්ත අංශයෙහි බලය සහ ඉන්ධන පිරිවැය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී නාමික වශයෙන් සියයට 17 කින් වැඩි විය. 1995 කාර්මික නිමැවුම් සඳහා වූ පිරිවැයෙන් බලශක්තිය (විදුලිය, ඉන්ධන හා අනෙකුත්) පිරිවැය සියයට 6 ක් විය. බලශක්ති වියදම ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන අංශයේ මුළු නිෂ්පාදන වියදමේ ප්‍රධාන අංශයක් වූ අතර රසායනික නිෂ්පාදන, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන අංශයේ මුළු නිෂ්පාදන වියදමෙන් සුළු කොටසක් විය.


## 4.5 ආයෝජන

### විදේශීය ආයෝජන

දේශීය ඉතිරි කිරීම් සහ ආයෝජන අතර පරතරය අඩුකිරීම සහ ආර්ථික සංවර්ධන වේගය දිරි ගැන්වීම තුලින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ වැදගත් කාර්යභාරයක් රට තුලට ගලා ආ විදේශීය ප්‍රාග්ධනය මගින් ඉටු කර ඇත. අනෙකුත් දියුණු වෙමින් පවතින රටවල් වලින් එල්ල වන තරගකාරීත්වය යටතේ වුවද, ජපානය, දකුණු කොරියාව, හොංකොං, සිංගප්පූරුව, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, ඉතාලිය, ඉන්දියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි රටවල් වලින් සැලකිය යුතු විදේශීය ප්‍රාග්ධන ප්‍රමාණයක් අද්දවා ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය.

විදේශීය ආයෝජන ප්‍රවර්ධනය සඳහා කටයුතු කරන ප්‍රධාන ආයතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (ශ්‍රී ලං.ආ.ම.) "ඒකීය ආයෝජන ප්‍රවර්ධන මධ්‍යස්ථානය" ලෙස ක්‍රියා කරමින්, රට තුලට ගලා එන විදේශීය ආයෝජන සඳහා පහසුකම් සැලසීම කරන ලදි. 1995 වර්ෂය තුලදී ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ ප්‍රචාරාත්මක කාර්යයන්හි විශේෂිත අංශය වූයේ කොළඹදී පවත්වන ලද ආයෝජන සමුළුව වේ. කෘෂිකාර්මික ද්‍රව්‍ය, රෙදිපිළි, සම් භාණ්ඩ, රබර්, පිඟන් භාණ්ඩ, ඉලෙක්ට්‍රොනික් සහ ප්‍රවෘත්ති තාක්ෂණය සම්බන්ධ බද්ධ ව්‍යාපාර සඳහා කලින් පිළියෙල කරගත් ව්‍යාපෘති යෝජනා මත

රූප සටහන 4.3
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත කළ හා දැනට කර ඇති ආයෝජන




ව්‍යවසායකයන් අතර සෘජු සාකච්ඡාවන් වලට මේ මගින් පහසුකම් සැපයුනි.

ශ්‍රී ලං.ආ.ම. මගින් අනුමත කල ව්‍යාපෘතීන් සංඛ්‍යාවේ සහ ආයෝජන ප්‍රමාණයන්ගේ සුළු පසුබෑමක් 1995 වර්ෂයේදී දක්නට ලැබුනි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පණතේ 17 වන වගන්තිය යටතේ 1995 දී අනුමත කරන ලද රුපියල් බිලියන 43 ක ආයෝජන ශක්‍යතාවයක් ඇති ව්‍යාපෘති 291 හා සැසඳීමේදී 1995 දී රුපියල් බිලියන 32 ක ආයෝජන ශක්‍යතාවයක් ඇති ව්‍යාපෘති 224 ක් අනුමත කර ඇත. මේ අනුව 1995 වර්ෂය අවසාන වනවිට අනුමත කළ මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාව 1,773 ක් විය. ඉදිරියේදී විශාල ආයෝජන කිරීමේ හැකියාව ඇති ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත ආයතන කිහිපයක්, 1995 වර්ෂය තුල ආයෝජනයන් සඳහා මෙරටට ගෙන්වා ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය. 1995 වර්ෂය තුළ අනුමත කල ආයෝජනයන්හි විදේශ ආයෝජන කොටස රුපියල් බිලියන 14 වූ අතර එය වර්ෂය තුළ අනුමත කළ ආයෝජන ප්‍රමාණයෙන් සියයට 43 ක් විය. 1995 වර්ෂය අවසාන වනවිට අනුමත කල මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් 1,132 ක් ශ්‍රී.ලං.ආ.ම. සමග ගිවිසුම් අත්සන් කර තිබුනි. ඇඟළුම් කර්මාන්ත දෙසීය වැඩසටහනට සම්බන්ධ ව්‍යාපෘතීන් 150 ක් ද ඇතුළුව, ගිවිසුම් අත්සන් කල ව්‍යාපෘතීන් 756 ක් 1995 වර්ෂය අවසන් වනවිට රුපියල් බිලියන 77 ක් ආයෝජනය කර තිබුණි. මෙහි විදේශීය ආයෝජන කොටස

**සංඛ්‍යා සටහන 4.11**

## ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1994 - 1995

| කාර්මික කාණ්ඩය | 1994 | | 1995 (අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස) රු. දශ ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස) රු. දශ ලක්ෂ |
| 1 ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 4,105 | 2,929 | 8,159 | 3,957 |
| 2 රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 144,131 | 60,820 | 153,664 | 73,007 |
| 3 දැව හා දැව නිෂ්පාදිත | 1,074 | 158 | 2,500 | 288 |
| 4 කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 459 | 616 | 519 | 574 |
| 5 රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 13,378 | 7,903 | 19,020 | 12,200 |
| 6 ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 8,146 | 4,502 | 9,160 | 6,120 |
| 7 සකස් කළ ලෝහ නිෂ්පාදිත | 887 | 354 | 1,252 | 722 |
| 8 අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 23,433 | 7,200 | 23,761 | 9,166 |
| 9 සේවා (ආ) | 10,047 | 3,553 | 15,332 | 6,919 |
| එකතුව | 205,660 | 88,035 | 233,367 | 112,953 |

(අ) තාවකාලික
(ආ) එයාර් ලංකා හැර

මූලය: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

රුපියල් බිලියන 52 හෙවත් මුළු ආයෝජන ප්‍රමාණයෙන් සියයට 68 ක් විය. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය, රබර්, ප්ලාස්ටික් නිෂ්පාදිත සහ අන් තැනක සඳහන් නොවූ කාර්මික නිෂ්පාදිත යන අංශයන් මෙම ආයොජනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් අවශෝෂණය කර ගන්නා ලදී.

1995 වර්ෂයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දේශීය ආදායම් පනත හා බදු සම්බන්ධිත නීති (සාමාන්‍ය දිරි දීමනා යෝජනා ක්‍රමය) යටතේ ව්‍යාපෘතීන් 62 ක් අනුමත කරන ලදී. මෙම ව්‍යාපෘතීන්හි අපේක්ෂිත මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 3.2 ක් වූ අතර, එහි විදේශ ආයෝජන දායකත්වය රුපියල් බිලියන 1.5 ක් හෙවත් සියයට 46 ක් විය.

විදේශ ආයෝජන අනුමත කිරීම් වල අඩු වීමක් සිදු වූවද, ඇඟළුම් කම්හල් දෙසිය වැඩසටහනට සම්බන්ධ ව්‍යාපෘතීන්ද ඇතුළුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට සම්බන්ධ

**සංඛ්‍යා සටහන 4.12**

## කාර්මික ව්‍යවසායයන්හි ප්‍රාදේශීය ව්‍යාප්තිය (අ)

සංඛ්‍යාවලින්

| දිස්ත්‍රික්කය | කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා කර්මාන්ත | ආයෝජන මණ්ඩලය යටතේ පවත්නා කර්මාන්ත | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | 17 වන වගන්තිය | ඇඟළුම් කම්හල් දෙසිය වැඩ පිළිවෙල | 16 වන වගන්තිය | |
| 1 කොළඹ | 1,211 | 187 | 16 | 193 | 1,607 |
| 2 ගම්පහ | 171 | 239 | 7 | 73 | 490 |
| 3 කළුතර | 45 | 18 | 10 | 14 | 87 |
| 4 ගාල්ල | 26 | 22 | 6 | 14 | 68 |
| 5 මහනුවර | 30 | 15 | 12 | 8 | 65 |
| 6 පුත්තලම | 17 | 16 | 12 | 10 | 55 |
| 7 කුරුණෑගල | 9 | 12 | 11 | 7 | 39 |
| 8 මාතර | 22 | 2 | 4 | 1 | 29 |
| 9 හම්බන්තොට | 18 | 1 | 7 | 1 | 27 |
| 10 රත්නපුර | 1 | 6 | 14 | 3 | 24 |
| 11 නුවරඑළිය | 3 | 6 | 11 | 3 | 23 |
| 12 බදුල්ල | 9 | 3 | 7 | 3 | 22 |
| 13 අනුරාධපුරය | 5 | 1 | 14 | 1 | 21 |
| 14 කෑගල්ල | 2 | 3 | 8 | 0 | 13 |
| 15 මාතලේ | 4 | 2 | 5 | 0 | 11 |
| 16 අම්පාර | 4 | 0 | 3 | 0 | 7 |
| 17 මොණරාගල | 1 | 0 | 5 | 1 | 7 |
| 18 පොළොන්නරුව | - | 1 | 4 | 0 | 5 |
| 19 වව්නියාව | - | 0 | 2 | 0 | 2 |
| 20 ත්‍රිකුණාමලය | - | 0 | 1 | 1 | 2 |
| 21 මඩකලපුව | - | 0 | 1 | 0 | 1 |
| ඔදුව්ක | 1,578 | 534 | 160 | 333 | 2,605 |

(අ) 1995 අවසානයේ පැවැති සංඛ්‍යාව

මූලයයන්: කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ව්‍යාපෘතීන්හි සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 1995 වර්ෂය තුල සියයට 13 කින් වැඩිවිය. පසුගිය වර්ෂය තුල මෙම වැඩිවීම සියයට 10 ක් විය. දැනට පවතින කර්මාන්ත වල ධාරිතාවය වැඩිවීම සහ නිෂ්පාදනය වැඩිවීම සේවා නියුක්තියෙහි මෙම සතුටුදායක ප්‍රවනතාවයට හේතු විය.

## දේශීය ආයෝජනය

ශ්‍රී ලං.ආ.ම. මගින් අනුමත කල ව්‍යාපෘතීන්හි, සැලකිය යුතු තරමේ දේශීය ආයෝජන ප්‍රමාණයක් දක්නට ලැබුනි. 1995 වර්ෂය අවසන් වනවිට, ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වු ව්‍යාපෘතීන් 756 ක දේශීය ආයෝජන ප්‍රමාණය, රුපියල් බිලියන 25 ක් හෙවත් මුළු ආයෝජන ප්‍රමාණයෙන් සියයට 32 ක් විය. මෙම ආයෝජනයන්ගෙන් වැඩි ප්‍රමාණයන් සැහැල්ලු සෙල්ලම් බඩු, කැට් නූල් සහ අමුරෙදි, ලී වලින් කරන ලද අත්කම් භාණ්ඩ, එළවළු සහ පළතුරු සැකසීම, මුළුතැන්ගෙයි උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ ඇඟළුම් කර්මාන්තය සඳහා අවශ්‍ය අමතර කොටස් යන නිෂ්පාදන අංශයන්හි යොදවා තිබුනි. 1995 වර්ෂයේදී අපේක්ෂා කරන ලද රුපියල් බිලියන 32 ක් වූ ආයෝජන ප්‍රමාණයෙන් රුපියල් බිලියන 18 ක් හෙවත් සියයට 57 ක් දේශීය සම්පත් මගින් සපයාගැනීමට බලාපොරොත්තු විය. එපමණක් නොව සාමාන්‍ය දිරි ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි දේශීය ආයෝජන කොටස රුපියල් බිලියන 1.7 ක් හෙවත් මුළු ආයෝජන ප්‍රමාණයෙන් සියයට 54 ක් විය.

මේ අතර 1995 දෙසැම්බර් මස අවසන් වනවිට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී තිබූ 1,578 ක්වූ මුළු ව්‍යාපෘතීන්හි ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 81.1 ක් විය. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනඃ රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදන සහ ආහාර, පාන වර්ග දුම්කොළ යන ප්‍රධාන කාර්මික නිෂ්පාදන කාණ්ඩයන්හි මෙම ආයෝජනයන් යොදවා තිබුණ අතර,පුද්ගලයන් 300,036දෙනෙකුට මේ මගින් රැකියා අවස්ථා සපයා දී තිබති.

## 4.6 කර්මාන්ත ස්ථානගතවීම

දැනට පවතින කර්මාන්ත ස්ථානගත වීමේ ව්‍යාප්තියෙන් පෙන්නුම් කරනුයේ කාර්මික සංවර්ධනය දිස්ත්‍රික්ක කිහිපයක් තුළ පමණක් කේන්ද්‍රගත වී ඇති බවය. එමනිසා කර්මාන්ත ප්‍රාදේශීයගතකරණය කෙරෙහි රජයේ කර්මාන්ත ප්‍රතිපත්තිය තුල වැඩි අවධානයක් යොමු වී ඇත. කර්මාන්ත ප්‍රාදේශීය ගත කිරීමේ ප්‍රධාන අරමුණු වනුයේ ප්‍රාදේශීයව ආර්ථික සංවර්ධනය ඇති කිරීම, ප්‍රධාන කාර්මික ප්‍රදේශවල ඇති තදබදය අඩුකිරීම සහ කර්මාන්ත මධ්‍යස්ථාන දෙසට ජනතාව .සංක්‍රමණය වීම අධෛර්යමත් කිරීම සහ ග්‍රාමීය සේවා වියුක්තිකයන් සඳහා රැකියා අවස්ථා වැඩි කිරීමය.

කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ කර්මාන්ත අතුරින් සියයට 77 ක් නැතහොත් ව්‍යවසායයන් 1,211 ක් කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා තිබුණු අතර සියයට 11 ක් නැතහොත් ව්‍යවසායයන් 171 ක් ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටා තිබිණි.

1995 වර්ෂයේ අවසානය වනවිට ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ වාණිජ කටයුතුවල නියැළුනු කර්මාන්ත 534 න් සියයට 35 ක් නැතහොත් ව්‍යවසායයන් 187 ක් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබුණු අතර, සියයට 45 ක් නැතහොත් ව්‍යවසායයන් 239 ක් ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටුවා තිබුණි. මෙම ව්‍යාප්තියට ප්‍රධාන හේතුව වූයේ බියගම සහ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි සපයා තිබූ ප්‍රමාණවත් යටිතල පහසුකම් වේ.

ආයෝජන මණ්ඩල පනතේ 16 වන වගන්තිය යටතේ වාණිජමය නිෂ්පාදන කටයුතු වල නියැලුනු ව්‍යවසායයන් 333 න් 193 ක් නැතහොත් සියයට 58 ක් කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථානගතව තිබුණු අතර සියයට 22 ක් නැතහොත් ව්‍යවසායයන් 73 ක් ස්ථානගතව පැවතියේ ගම්පහ දිස්ත්‍රික්කයේය. යටිතල පහසුකම් ගැන සැලකිලිමත්වීම මෙම ව්‍යාප්තියට හේතු විය. ආයෝජන මණ්ඩල පනතේ 16 වන වගන්තිය යටතේ එන ව්‍යවසායයන් හි විශේෂ ලක්ෂණයක් වූයේ ඒවායින් සමහරක් මොණරාගල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, මාතර සහ මාතලේ වැනි අඩු දියුණු ප්‍රදේශයන්හිද පිහිටුවා තිබීමය.

ඇගළුම් කම්හල් දෙසීය වැඩසටහන යටතේ, 1995 අවසානය වනවිට දිස්ත්‍රික්ක 21 ක ඇඟළුම් කම්හල් 160 ක් නිෂ්පාදන කටයුතුවල නියැලුණි. මේවායින් සියයට 86 ක් නැතිනම් ඇඟළුම් කම්හල් 137 ක් ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්ක්කවලින් පිටත පිහිටුවා තිබුණි. අනුරාධපුර, රත්නපුර, පුත්තලම සහ කුරුණෑගල වැනි අඩු දියුණු ප්‍රදේශවල පිහිටි ඇඟළුම් කම්හල් ගණන අනුපිළිවෙලින් 14. 14,12 සහ 11 ක් විය.

ස්ථාන ස්වල්පයක කර්මාන්ත කේන්ද්‍රගතවීම ආශ්‍රිතව පැන නගින, සෞඛ්‍යය සහ පරිසර දූෂණය ආදිය සම්බන්ධ ගැටළු සහ තදබදයන් අවම කිරීමටත්, ග්‍රාමීය ප්‍රදේශයයන්හි කර්මාන්ත කටයුතු ප්‍රවර්ධනය කිරිම සඳහාත්, 1995 දී කාර්මික ජනපද සංවර්ධන වැඩසටහන දියත් කරන ලදි. සීතාවක හා කටාන පිහිටි ජාත්‍යන්තර මට්ටමේ කාර්මික ජනපද දෙක මෙම වැඩසටහනට ඇතුලත්ය. ජපන් රජයේ ආධාර ඇතිව මෙම කාර්මික ජනපද දෙකෙහි මූලික වැඩ කටයුතු 1995 දී ආරම්භ කරන ලදී. මීට අමතරව, 1995 දී ප්‍රාදේශීය කාර්මික ජනපද වැඩබිම් 21 ක් තෝරාගත් අතර, ඒවායෙහි මූලික සංවර්ධන වැඩකටයුතු පෞද්ගලික අංශය විසින් අරඹන ලදි. මෙම වැඩ සටහන යටතේ අනුරාධපුර, පුත්තලම, මොණරාගල, බදුල්ල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල පිහිටුවීමට යෝජිත කාර්මික ජනපද ප්‍රමාණය අනු පිළිවෙලින් 4,4,2,2, සහ 2 බැගින් වේ.

## 4.7 කර්මාන්ත ප්‍රතිපත්තිය

වෙළෙඳපල නැඹුරුව, කාර්යක්ෂමතාවය වර්ධනය කිරිම, දේශීය සහ විදේශීය ආයෝජන දිරි ගැන්වීම සහ කාර්මික විවිධාංගීකරණය තුලින් තිරසාර කාර්මික වර්ධනයක් ලබා කර ගැනීම, 1994 වර්ෂයේ සිට හඳුන්වා දුන් රජයේ කාර්මික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ විය. සාර්ව ආර්ථික ස්ථායිතාවය ඇතිකර ගැනීම තුලින් තිරසාර කාර්මික සංවර්ධනයකට අවශ්‍ය හිතකර පදනමක් සැපයීම මගින් මෙම අරමුණු ඉටුකර ගැනීමට රජය අපේක්ෂා කරණු ලබයි. මෙම රාමුව තුළ ප්‍රාග්ධනය සැපයීමෙනුත්, නව තාක්ෂණය හා අපනයන වෙළෙඳපොලවල් සඳහා අඛණ්ඩ ප්‍රවේශ මාගී සැපයීමෙනුත් ඉහත ක්‍රියාවලිය තුළ සජීවි දායකත්වයක් ඉටුකරනු ලබන විදේශීය ආයෝජන උනන්දු කරවනු ඇත.

සමහර දේශීය කර්මාන්ත, තීරුබදු සහ තීරුබදු නොවන ආරක්ෂණ පරිසරයක් මධ්‍යයේ සංවර්ධනය වී ක්‍රියාත්මක වී ඇති නිසා, අඩු ආරක්ෂණ මට්ටම් කරා රට ගමන් කරන

බැවින් මෙම කර්මාන්තවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා සහ කාර්මික සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහයට මෙම කර්මාන්ත එක්කර ගැනීම සඳහා වෙළඳ කටයුතු ලිහිල් කිරීම සහ තීරුබදු ප්‍රතිසංස්කරණ තුලින් රජය පියවර රැසක් ගෙන ඇත. මෙහිදී ආනයන භාණ්ඩ කිහිපයක් සඳහා, 1994 දී බලපවත්වනු ලැබූ ඉහළ තීරුබදු කාණ්ඩයන් 1995 දි පහළ තීරුබදු කාණ්ඩ දක්වා අඩු කරන ලදී. 1998 දී සියයට 15 ක සම තීරුබදු අනුපාතිකයක් පවත්වා ගැනීමට රජය අපේක්ෂා කරනු ලබයි. තවදුරටත්, ආයතනයන්ගේ පිරිවැටුමෙන් නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල දී බදු අයකිරීම වලක්වනු සඳහා, එකතු කළ වටිනාකම මත පදනම් වූ භාණ්ඩ හා සේවා බදු ක්‍රමයක් යෝජනා කර ඇත.

කාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය මූලික යටිතල ව්‍යුහ පහසුකම් සපයා දීමේ වැදගත්කම හඳුනා ගැනීමෙන් අනතුරුව, මෙම අංශය සංවර්ධනය කිරීම සඳහා රජය ඵලදායක පියවරවල් රැසක් ගෙන ඇත. කර්මාන්තවලට අවශ්‍ය යටිතල ව්‍යුහ පහසුකම් සපයා දීමේදී, සෞඛ්‍ය, අධ්‍යාපනය, වෘත්තිය පුහුණුව, පරිසර සංරක්ෂණය සහ ග්‍රාමීය ප්‍රදේශවල යටිතල ව්‍යුහ පහසුකම් වැඩිදියුණු කිරීම යන අංශවල මූලික ප්‍රාග්ධන ආයෝජනයන් කිරීමට රජය බලාපොරොත්තු වන අතර, ඉදිකර පවත්වාගෙන යාමේ ක්‍රමය (BOO) සහ ඉදිකර පවරාදීමේ ක්‍රමය (BOT) යටතේ විදුලි බලය, විදුලි සංදේශ, මහා මාර්ග සහ ජල සම්පාදනය වැනි අංශයන්හි ආයෝජනය පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. යටිතල ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ ලේකම් කාර්යාලය (SIDI) 1995 සැප්තැම්බර් මාසයේ දී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා කටයුතු කරන තනි සේවා කේන්ද්‍රය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යභාරය ශක්තිමත් කිරීම සඳහා එය සමග ඒකාබද්ධ කරනු ලැබූ අතර, මෙමගින් මහා පරිමාන විදුලිය, විදුලි සංදේශ, ගමනාගමන , වරාය, ජලසම්පාදන හා ජලප්‍රවාහනය, අපද්‍රව්‍ය ඉවත් කිරීම්, වෙළඳ සංකීර්ණ ගොඩනැංවීම සහ කර්මාන්ත පුර පිහිටුවීමේ ව්‍යාපෘතීන් මෙහෙයවීමට අපේක්ෂා කරනු ලබන අතර ඒ සඳහා ඉදිකර පවත්වාගෙන යාමේ ක්‍රමය (BOO) සහ ඉදිකර පවරාදීමේ ක්‍රමය (BOT) උනන්දු කිරීමටද අපේක්ෂා කරනු ලබයි. මෙම යටිතල ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සඳහා යටිතල ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුදලක් පිහිටුවීමටද සලකා බලනු ඇත.

නව තාක්ෂණය සහ ශිල්පීය දක්ෂතා සංවර්ධනය කිරීමේ ක්ෂේත්‍රය තුල, පර්යේෂණ විද්‍යාඥයින්, ඉංජිනේරුවන් සහ කාර්මිකයන් සම්බන්ධයෙන් පවතින තාක්ෂණික සහ ශිල්පීය සංවර්ධන කටයුතු ආශ්‍රිත අඩුපාඩු ඉවත් කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ මණ්ඩලය මගින් කටයුතු අරඹා ඇත. තවදුරටත්, 1996 වර්ෂයේ අයවැය ලේඛනය මගින් ඉහළ එකතු කළ අගයක් ජනිත කරවන සහ උසස් තාක්ෂණය භාවිතා කරනු ලබන ආයෝජකයින් සඳහා, සිත්ගන්නා සුළු බදු සහ ආනයන තීරුබදු සහන රැසක් ප්‍රකාශයට පත්කරන ලදි. මෙම විශේෂ දිරිගැන්වීම ක්‍රමය යටතේ අවම වශයෙන් රුපියල් දශලක්ෂ 10 ක් නිෂ්පාදන කටයුතු සඳහා ආයෝජනය කරනු ලබන සහ 50 දෙනෙකුට රැකියා පහසුකම් සපයාදෙනු ලබන නව නිෂ්පාදන සහ සේවා සමාගම් සඳහා වසර 5 ක බදු විරාමයක් ලබාදෙන ලදී. උසස් තාක්ෂණය සඳහා ආයෝජනය කරනු ලබන දැනට පවතින කර්මාන්ත හා සේවා සමාගම් සඳහා ද වාර්ෂික උද්ධමනය සඳහා ගැලපීමෙන් අනතුරුව, වැඩි වූ ලාභාංශ පදනම මත මෙම දිරිගැන්වීමේ ක්‍රමය ව්‍යාප්ත කරන ලදී. රුපියල් දශලක්ෂ 10 කට වැඩියෙන් උපකරණ සඳහා ආයෝජනය කරනු ලබන නව සමාගම් සඳහා, තීරු බදු රහිත ආනයන සහ ඒ හා සම්බන්ධ පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම් ලබා දෙන අතර, යන්ත්‍ර සහ උපකරණ සඳහා අවම වශයෙන් රුපියල් දශලක්ෂ 2.5 ක් ආයෝජනය කරනු ලබන දැනට පවත්නා සමාගම් වලටද මෙම සහන ලැබේ. දැනට පවතින සහන වලට අමතරව, රුපියල් දශලක්ෂ 50 කට වඩා යන්ත්‍ර සහ උපකරණ සඳහා ආයෝජන කරනු ලබන සහ අවම වශයෙන් රැකියා අවස්ථා 50 ක් සලසන ආයෝජන මණ්ඩලයට අයත් අපනයන මත යොමු වූ කර්මාන්ත වලට, වසර 5 ක බදු විරාමයක් ලබා දුනි. මෙයට අමතරව ආයෝජන ප්‍රමාණය සහ සේවක සංඛ්‍යාව පදනම් කර ගනිමින් මහා පරිමාන සංවර්ධන ව්‍යාපෘති වලට වසර 10 සිට 20 දක්වා බදු විරාම පහසුකම් ලබා දෙන ලදි.

ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යවසායයන් සඳහා ඉහළ නම්‍යතාවයක් ලබාදීම, ශ්‍රී ලංකාව ජනප්‍රිය ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම සහ නීති විරෝධීව රෙදිපිළි මෙරටට ගෙන්වීම අධෛර්යමත් කිරීම අරමුණු කරගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ඇහළුම් කම්හල්වල නිමැයුමෙන් සියයට10 ක ප්‍රමාණයක් දේශීය වෙළඳපොලට නිකුත් කිරීමට 1995 ජනවාරි මස සිට අවසර දෙන ලදී.